# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 859/12 – 1995 පෙබරවාරි 23 වැනි බ්‍රහස්පතින්ද – 1995.02.23

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස : (I) වැනි ජෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

ඒල්. ඩී – බී. 21/78 iii

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

24 ආ වගන්තිය යටතේ නියමය

1995 අංක 1 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතින් අවසන්වරට සංශෝධිත, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 24 අ වගන්තිය සමඟ කියවිය යුතු 24ආ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය රිචඩ් පතිරණ වන මම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, කැළණිය විශ්ව විද්‍යාලයයේ සනාථන සභාවේද, පාලක සභාවේ ද, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලයේ පාලක සභාවේ ද එකඟත්වය ඇතිව මේ නියමයෙන් :

(i) ආයුර්වේද වෛද්‍ය විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනය ලබාදීමේ, දියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ කාර්ය සඳහා උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතනයක් වශයෙන් ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය 1995 මාර්තු මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පිළිගනිමි.

(ii) එකී ආයතනය කැළණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධ කරමි.

(iii) ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය යන නාමය හා අභිධානය ඒ ආයතනයට දෙමි.

"

රිචර්ඩ් පතිරණ,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය.

1995 පෙබරවාරි මස 22 දින,
කොළඹ දීය.

03 –178

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

I A — D 035514—1,060 (95/02)